සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**45 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**භරත නැටුම් I, II**
பரதநாட்டியம் I, II
Bharatha Dancing I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## භරත නැටුම් I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** නාට්‍ය වේදය යන නාමයෙන් හඳුන්වනු ලබන්නේ,
(1) රිග් වේදයයි. (2) යජුර් වේදයයි. (3) ගන්ධර්ව වේදයයි. (4) අථර්වන් වේදයයි.

**2.** කතරගම දෙවියන්ගේ පිහිට පතා නර්තනය කරන ග්‍රාමීය නර්තනය වන්නේ,
(1) කුම්මි ය. (2) කාවඩි ය. (3) කරගම් ය. (4) කෝල

**3.** සම්යුත හස්තවලට අයත් දාහතරවෙනි හස්තය වන්නේ,
(1) සම්පුට ය. (2) චක්‍ර ය. (3) පාස ය. (4) කීලක ය.

**4.** බ්‍රාහ්මණ හස්තාව ගන්නා නවග්‍රහ හස්තය වන්නේ,
(1) අංකාරක ය. (2) සුක්‍ර ය. (3) බුධ ය. (4) බ්‍රහස්පති ය.

**5.** රාමා සහ සීතා මුණගැසෙනවිට සීතාගේ දක්නට ලැබෙන ශිරෝ, දිෂ්ඨි භේදා අනුපිළිවෙළින් වන්නේ,
(1) උල්ලෝකිත, තුත ය. (2) අදෝමුඛ, අවලොකිත ය.
(3) අවලෝකිත, අදෝමුඛ ය. (4) තුත, උල්ලෝකිත ය.

**6.** 'වසෝ' යන්නෙහි තේරුම කුමක් ද?
(1) නිවැරදි උච්චාරණය (2) වේගය (3) උනන්දුව (4) ඒකාන්ත වශයෙන් ම

**7.** අයියා සහ මල්ලී යන අය අභිනය කිරීම සඳහා භාවිත කරන හස්ත මුද්‍රා වන්නේ,
(1) අරාල, අරාල ය. (2) ත්‍රිපතාක, අරාල ය.
(3) මයූර, අරාල ය. (4) මයූර, මයූර ය.

**8.** තෙයි දිදි තෙයි - මෙහි මුරුදංග සොර්කට්ට වන්නේ,
(1) තක තදිංගිනතොම් (2) තකදිකු තදිංගිනතොම්
(3) තදිංගින තොම් (4) ගිනතොම්

**9.** අක්ෂර එකතුව 12 වන තාල වන්නේ,
(1) කණ්ඩජාති මට්ටිය තාලය, චතුස්‍ර ජාති අඩතාලය වේ.
(2) සංකීර්ණ ජාති ත්‍රිපුට තාලය, මිශ්‍රජාති ත්‍රිපුට තාලය වේ.
(3) සංකීර්ණ ජාති ජම්පෙ තාලය, මිශ්‍ර ජාති රූපක තාලය වේ.
(4) චතුස්‍ර ජාති අඩ තාලය, තිස්‍ර ජාති අඩතාලය වේ.

[දෙවැනි පිටුව බලන්න.

**10.** ඔබ ඉගෙනගත් අලාරිප්පුහි රාගය හා තාලය අනුපිළිවෙළින් සඳහන් වරණය වන්නේ,
(1) තිස්‍ර ඒක, නාට්ටෛ වේ. (2) නාට්ටෛ, තිස්‍ර ඒක වේ.
(3) සාවේරි, රූපක වේ. (4) ආරබි, ආදි වේ.

**11.** රාජ පරම්පරාවේ සම්ප්‍රාප්තිය පිළිබඳ කියවෙන වන්නම කුමක් ද?
(1) කිරළා වන්නම (2) ඊරඩි වන්නම
(3) උරගා වන්නම (4) උදාර වන්නම

**12.** රත්‍රන්, තඹ සහ යකඩ වැනි ද්‍රව්‍ය අභිනය කිරීම සඳහා භාවිත කරන අසම්යුත මුද්‍රාව වන්නේ,
(1) භ්‍රමර වේ. (2) හම්සාස්‍ය වේ. (3) චතුර වේ. (4) කටකාමුඛ වේ.

**13.** හලාවත ප්‍රදේශයෙහි දැනට භාවිතයෙහි ඇති කුතු වන්නේ,
(1) වඩමෝඩි ය. (2) වේත්තියල් ය.
(3) නාට්ටු කුතු ය. (4) තෙණ්මෝඩි ය.

**14.** 'වාන් කෙලායම්' යනුවෙන් හඳුන්වන්නේ,
(1) හිමාලමලෛ ය. (2) තිරුවණ්ණාමලෛ ය.
(3) වසන්තමලෛ ය. (4) පොන්මලෛ ය.

**15.** 'අනංගයා' යනුවෙන් හඳුන්වන්නේ,
(1) ඉන්දිරන් ය. (2) මන්මදන් ය. (3) කුබේරන් ය. (4) නිරුත්ති ය.

**16.** 'වීණා විද්‍යාධර' යනුවෙන් පිදුම් ලැබූ රජුගේ නම වන්නේ,
(1) රාජසිංහ ය. (2) රාජරාජචෝලන් ය.
(3) මහේන්ද්‍රවර්මා ය. (4) සිම්හවිෂ්ණු ය.

**17.** පහත සඳහන් ඒවායින් රැකියා සම්බන්ධ නර්තන ගීත නිර්මාණයක් වන්නේ,
(1) "කාවඩි එඩුත්තු වන්දෝම් ..." ය. (2) "මංකෙයර් එල්ලෝරුම් ..." ය.
(3) "කොලුන්දු කොයිවෝමෙ ..." ය. (4) "කෝලාඩුවෝම් ..." ය.

**18.** සංග, චක්‍ර යන ඒවායේ නිර්මාණය
(1) ලස්සන ය. (2) හැඩ ය. (3) පිදීම ය. (4) උපදේස ය.

**19.** 'තණ්ණුමෛ' වාද්‍ය යනු
(1) මිරුදංග වේ. (2) වීණාව වේ. (3) වයලීනය වේ. (4) තවිල් වේ.

**20.** භරත නර්තනාංග අතුරෙන් හෘදය ලෙස හැඳින්වෙන නර්තන අංගය වන්නේ,
(1) පදම් ය. (2) අලාරිප්පු ය. (3) වර්ණම් ය. (4) තිල්ලානා ය.

**21.** හම්සත් ඇත් වේෂය ගෙන එනවිට ක්‍රිෂ්ණා ඔහුගේ දළ කඩා නටන ලද කුතු
(1) මට්කුත්තු ය. (2) කොඩුකොට්ටි ය. (3) තුඩිකුතු ය. (4) අල්ලියම් ය.

**22.** ;;; තත්, තාම් දිත්, තෙයි, තාම් – මෙහි මාත්‍රා එකතුව
(1) 9 කි. (2) 12 කි. (3) 14 කි. (4) 16 කි.

**23.** ස්ත්‍රී ලාලිත්‍යාංග චලන ඇතුළත් **නොවන්නේ**,
(1) ලෝක ධර්මිවල ය. (2) නාට්‍ය ධර්මිවල ය.
(3) නර්තන ධර්මිවල ය. (4) ශාස්ත්‍රීය ධර්මිවල ය.

**24.** සුදු වස්ත්‍ර සමගින් මුළු රාත්‍රියක පුරා පෙරහුරුව
(1) දිනක්කුතු ය. (2) ඌරුක්කුච් චෙල්ලල් ය.
(3) අඩුක්කු පාර්ත්තල් ය. (4) කිළමෛ කුතු ය.

**25.** රජු සහ බුද්ධිමතුන් සිටින සභාවක නර්තනය කරනු ලබන කුතු වන්නේ,
(1) නාඩගම් ය. (2) තෙන්මෝඩි ය.
(3) පොදුවියල් ය. (4) වේත්තියල් ය.

[තුන්වැනි පිටුව බලන්න.

**26.** 'කවණ් ගායනය' හෝ 'වෙන්වීම' යන සංකල්පය පදනම් කරගෙන නිර්මාණය වී ඇති නර්තනාංගය වන්නේ,
(1) තෝඩයමංගලම් ය. (2) කෞත්වම් ය.
(3) පදම් ය. (4) ජාවලි ය.

**27.** නටුවාංග තාලම්වල දකුණු තාලයෙහි ශබ්දයෙන් කියවෙන දෙවියන් වන්නේ,
(1) ශිව ය. (2) විෂ්ණු ය.
(3) ශක්ති ය. (4) බ්‍රහ්මා ය.

**28.** පහත සඳහන් වඩමොඩි කුත්තුහි රසය **නොවන්නේ,**
(1) වීර ය. (2) කෝපය ය.
(3) හැඬීම ය. (4) පුදුමය ය.

**29.** තාණ්ඩව නර්තනය පිරිමින් විසින් ශක්තිමත්ව නර්තනය කිරීම හැඳින්වෙන්නේ,
(1) උත්තද ප්‍රයෝග ලෙස ය. (2) සුකුමාර ප්‍රයෝග ලෙස ය.
(3) ශුද්ද පූර්වරංග ලෙස ය. (4) චිත්‍ර පූර්වරංග ලෙස ය.

**30.** X තීරය, Y තීරය සමග නිවැරදි අනුපිළිවෙළට ගළපන ලද වරණය වන්නේ,

| | X | | Y |
|---|---|---|---|
| I. | මුනි තාණ්ඩව | A | රත්න සභාව |
| II. | ඌර්ත්තුව තාණ්ඩව | B | තාම්‍ර සභාව |
| III. | සන්ධ්‍යා තාණ්ඩව | C | රජිත සභාව |

(1) A, B, C ය. (2) B, A, C ය. (3) C, A, B ය. (4) C, B, A ය.

● පහත එවා පදනම් කරගෙන **31** සහ **32** දක්වා ඇති ප්‍රශ්නවලට සුදුසු වරණය තෝරන්න.

A - බටනලා වාදනයා හා යාල් ගුරුවරයා පිළිබඳ කියැවෙන්නේ
B - 'සිත්තන්නවාසල්' සිතුවම් පිළිබඳව කියැවෙන්නේ
C - නර්තනය ඉදිරිපත් කිරීම සඳහාම වෙන් වූ වේදිකාව ආඩම්බලම් වේ.
D - මිනිසුන් කාණ්ඩ වශයෙන් ජීවත් වූ නිසා කාණ්ඩ නර්තන ඉදිරිපත් කරන ලදී.
E - සොර්ක්කම්, පාණ්ඩරංගම් වැනි නර්තන ඉදිරිපත් කර ඇති බවට සාක්ෂි සඳහන් වේ.

**31.** මෙහි සඳහන් ඒවා අතුරෙන් සංකමරුවිය යුගයට අයත් වන්නේ,
(1) A සහ C පමණි. (2) C සහ D පමණි. (3) D සහ E පමණි. (4) E සහ B පමණි.

**32.** මෙහි සඳහන් ඒවා අතුරෙන් පල්ලව යුගයට අයත් වන්නේ,
(1) A සහ C පමණි. (2) A සහ D පමණි. (3) A සහ E පමණි. (4) B සහ E පමණි.

● පහත වගුව පදනම් කරගෙන **33** සිට **35** දක්වා ඇති ප්‍රශ්නවලට සුදුසු වරණය තෝරන්න.

| රසය | | දෙවියන් | විරුද්ධ රසය | වර්ණය |
|---|---|---|---|---|
| (i) | ශෘංගාර | A | භීබත්සයය | B |
| (ii) | C | යමන් | D | අළු පාට |
| (iii) | රෞද්‍ර | E | ආශ්චර්ය | F |

**33.** A සහ B සංකේතවලට ගැළපෙන්නේ,
(1) විෂ්ණු, සුදු පාට ය. (2) මහාරාජ, සුදු පාට ය.
(3) මහාරාජ, කොළ පාට ය. (4) විෂ්ණු, කොළ පාට ය.


**34.** C සහ D සංකේතවලට ගැළපෙන්නේ,
(1) භයානක සහ වීරය වේ. (2) කරුණාව සහ රෞද්‍ර වේ.
(3) කරුණාව සහ හාස්‍යය වේ. (4) භයානක සහ ආශ්චර්ය වේ.

**35.** E සහ F සංකේතවලට ගැළපෙන්නේ,
(1) රුද්‍රන් සහ රතු පාට වේ. (2) බ්‍රහ්මා සහ කළු පාට වේ.
(3) රුද්‍රන් සහ නිල් පාට වේ. (4) බ්‍රහ්මා සහ කහ පාට වේ.

[හතරවැනි පිටුව බලන්න.


- **36** සිට **40** දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට අදාළව දී ඇති රූපසටහන ආශ්‍රයෙන් සුදුසු වරණය තෝරන්න.

**36.** මෙම රූපයේ දැක්වෙන සුසිර වාද්‍ය භාණ්ඩය



(1) හාමෝනියම් ය.
(2) ශ්‍රැති පෙට්ටිය ය.
(3) මෙලොඩිකාව ය.
(4) මගුඩි ය.

**37.** මෙම රූපයෙන් දැක්වෙන හස්ත මුද්‍රාව කුමක් ද?



(1) චන්ද්‍රකලා
(2) මෘරුගාශීර්ෂ
(3) සිංහමුඛ
(4) ප්‍රාලම්බ

**38.** මෙම රූපයෙන් දැක්වෙන ඉන්දීය ශාස්ත්‍රීය නර්තනය කුමක් ද?



(1) මෝහිනි නර්තනය
(2) මණිපුරි
(3) කතක්
(4) ඔඩිසි

**39.** මෙම රූපයෙන් දැක්වෙන රසය කුමක් ද?



(1) රෞද්‍ර
(2) භීබත්සාය
(3) ආශ්චර්ය
(4) වීර

**40.** මෙම රූපයෙන් දැක්වෙන කලාකරුවා



(1) පොන්නෙයාපිල්ලෙ ය.
(2) වලුවූර් රාමයියාපිල්ලෙ ය.
(3) මීනාක්ෂි සුන්දරම්පිල්ලෙ ය.
(4) චින්නයියා ය.

* *

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

45 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| භරත නැටුම් | I, II |
| பரதநாட்டியம் | I, II |
| Bharatha Dancing | I, II |

## භරත නැටුම් II

※ **පළමු** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ **එක්** ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) මල් අතෙහි තබාගෙන නර්තනයෙහි යෙදෙන නර්තනය කුමක් ද?

(ii) උඩරට නර්තනයෙහි පාද ස්ථානය හැඳින්වෙන්නේ කෙසේ ද?

(iii) මධ්‍යම රාත්‍රියේ භූතගණංගල් සමග දෙවියන් විසින් සොහොනෙහි නර්තනය කරන ලද තාණ්ඩව නර්තනය කුමක් ද?

(iv) 'වංගියම්' යනුවෙන් හඳුන්වනු ලබන සංගීත භාණ්ඩය කුමක් ද?

(v) පංච ඊතලයෙහි ඇතුළත් දුක හා ශෝකය ඇති කරවන ඊය කුමක් ද?

(vi) 'සත්‍රියසිගාමනී' යනුවෙන් සම්මානනීය නාමය ලබා ඇති රජතුමාගේ නම කුමක් ද?

(vii) මහාපලිච් චක්‍රවර්තීගේ අහංකාරකම නැති කිරීමට දෙවියන් විසින් ගනු ලැබූ අවතාරය කුමක් ද?

(viii) මව හා දරුවාගේ සම්බන්ධතාව නිරූපණය කරනු ලබන භාවය කුමක් ද?

(ix) කණ්ඩිකෙ කොටස් ඇතුළත් නර්තන අංග **දෙකක්** සඳහන් කරන්න.

(x) මුරුදංග වර්ග **දෙක** සඳහන් කරන්න.

**2.** (i) පළවෙනි "දිත් තෙයුන්ද තාතෙයි" අඩව්වෙහි සම්ප්‍රදායික නම සහ තාලය වෙන වෙන ම ලියන්න.

(ii) ඉහත (i) හි සඳහන් අඩව්වෙහි භාවිත කරන මුද්‍රා සහ පාද ස්ථාන සඳහන් කරන්න.

(iii) ඉහත (i) හි සඳහන් කළ අඩව්වෙහි තාල අංග සමග ත්‍රිකාල ලියන්න.

**3.** (i) 'තන්ජෙයි පෙරුවුඩයාන් පේරිසෙ' යන ග්‍රන්ථයෙහි රචකයාගේ නම සඳහන් කරන්න.

(ii) ඉහත (i) හි සඳහන් කරනු ලැබූ කලාකරුවා විසින් නිර්මාණය කරන ලද නර්තනාංග **හතරක්** ලියන්න.

(iii) එම කලාකරුවාගේ ජීවන තොරතුරු කෙටියෙන් විස්තර කරන්න.

**4.** පහත සඳහන් හස්තවලට අයත් විනියෝග ශ්ලෝක සහ එහි අර්ථය ලියන්න.

(i) අරාල හස්තය (ii) උත්සංග හස්තය (iii) කර්තරීස්වස්තික හස්තය

**5.** (i) ග්‍රාමීය සංගීත සම්භාණ්ඩ **දෙකක්** සඳහන් කරන්න.

(ii) 'රාජ වාද්‍යයම්' නමින් හැඳින්වෙන සම්භාණ්ඩය ඇඳ එහි කොටස් නම් කරන්න.

(iii) ඉහත (ii) හි සඳහන් වාද්‍ය භාණ්ඩය පහත සඳහන් අංග පාදක කොටගෙන විස්තර කරන්න.

- නිර්මාණය
- වෙනත් නම්
- භාවිත කරන ක්‍රමය

**6.** (i) කතන්දරය පාදකකොට කරන ඉන්දීය ශාස්ත්‍රීය නර්තනය කුමක් ද? එය අයත් ප්‍රාන්තය සඳහන් කරන්න.

(ii) ඉහත (i) හි ශාස්ත්‍රීය නර්තනයෙහි විශේෂ ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

(iii) ඔබ සඳහන් කර ඇති ශාස්ත්‍රීය නර්තනයෙහි නළුවන්ගේ වේෂ නිරූපණය සඳහන් කර උදාහරණ සහිතව විස්තර කරන්න.

**7.** පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) කීර්තණම්

(ii) සොර්කට්ටු

(iii) පදම්

***